# මල් කැඩීම

උඩු සිත යටි සිතට සපයන තොරතුරු යටි සිතෙහි තැන්පත් වන්නේ යැයි සිතමු. යටි සිතෙහි, උඩු සිතට ඇති වී උඩු සිත විසින් යටි සිතට සන්නිවේදනය මේ තොරතුරුවලට අමතර ව යටි සිතෙහි ඇතිවන සිතිවිලි ද තැන්පත් වන බව පෙනී යයි. ඒ ඒ තොරතුරු යටි සිතෙහි තැන්පත්වන්නේ කෙසේ දැයි අපි නොදනිමු. එහෙත් ඒ තොරතුරු තැන්පත් වන්නේ අප උඩු සිත ආශ්‍රිව යොදාගන්නා සංකල්ප (සංකල්පයක් යනු වචන සමූහයක් හෝ තනි වචනයක් හෝ පමණක් නො වෙයි. සංකල්පයක් චිත්ත රූපයක් විය හැකි ය.) සංකේත ආදිය උපයෝගීකරගනිමින් නො වෙයැයි සිතාගැනීමට හැකි ය. උදාහරණයක් .ලෙස පරිගණකය ගත හැකි ය. එහි දත්ත ගබඩාකෙරෙන්නේ අප දන්නා කිසිම භාෂාවක් ඇසුරුකරමින් නො වෙයි.

යටි සිතෙහි තොරතුරු තැන්පත්වීමත් සමග යටි සිත ඒ තොරතුරු මත පදනම් වී යම් ක්‍රමයකට ක්‍රියාත්මක වෙයි. ඒ ක්‍රමය සංසාර අත්දැකීම් නිසා මෙන් ම මේ භවයේ සංස්කෘතික බලපෑම් නිසා ද තීරණයවන්නේ වන්නේ යැයි සිතමු. එයට බලපාන තර්කයක් හෝ ඒ පදනම්වන න්‍යායක් හෝ ඇතැයි අපි නො සිතමු. එහෙත් යටි සිත ක්‍රියාත්මක වී ලබාගන්නා ඇතැම් තීරණ  උඩු සිතට ද දැනුම් දෙන බව පැහැදිලි ය.

ඉහත සඳහන් කරුණ තවදුරටත් තේරුම්ගැනීම සඳහා අපි නැවතත් ජ්‍යාමිතියේ නිර්මාණයට යමු. යම් ප්‍රතිඵලයක් සාධනයකිරීම සඳහා නිර්මාණයක් අවශ්‍ය වූ විට උඩු සිතට ඒ නිර්මාණයකිරීමට නො හැකි වෙයි. එවැනි අවස්ථාවක උඩු සිත යටි සිතට තම ප්‍රශ්නය සන්නිවේදනය කරයි. යටි සිත එසේ සන්නිවේදනය කෙරෙන ප්‍රශ්නය විසඳීමට සූදානම් වෙයි. එහි දී යටි සිත පැරණි අත්දැකීම් යොදාගනිමින් යම් නිර්මාණයක් උඩු සිතට සන්නිවේදනයකරයි. උඩු සිත ඒ අනුව ක්‍රියාත්මක වී ඒ නිර්මාණය යොදාගනිමින් අවශ්‍ය ප්‍රතිඵලය සාධනය කිරීමට උත්සාහගනියි. ඇතැම් විට ඒ උත්සාහය අසාර්ථකවීමට ද ඉඩ ඇත. එවිට උඩු සිතට සිදුවන්නේ වෙනත් නිර්මාණයක් එවන ලෙස යටි සිතට දැන්වීමට ය.

ඉහත සඳහන් ආකෘතිය බටහිර ආකෘතියෙන් වෙනස්බව පැහැදිලි ය. බටහිර ආකෘතියෙහි, උදාහරණයකට ලකාන් ආකෘතිය සැලකුවහොත්, අපට පෙනී යන්නේ ලබ්ධිය උඩු සිතෙන් ස්වායත්තව ක්‍රියාත්මකවන බව ය. ලබ්ධිය ඇතිවන්නේ කෙසේ දැයි ලකාන් ආකෘතියෙහි නො කියැවෙයි. ලබ්ධිය සර්වබලධාරී දෙවිකෙනකු මෙන් පවතිමින් උඩු සිතට යම් යම් උපදෙස්දීමක් කරන්නේ ය යන්න අපට ඒ ආකෘතියෙන් ඉගෙනගත හැකිවෙයි. එහෙත් යටි සිත පිළිබඳ අපේ ප්‍රවාදය එසේ නො වෙයි. යටි සිත හා උඩු සිත අතර ඒකපාර්ශ්වික සම්බන්ධයක් එහි නැත. එහි යටි සිත පමණක් උඩු සිතට යම් යම් දෑ සන්නිවේදනය නො කරයි. එහි දී යටි සිත උඩු සිතට යම් යම් දෑ සන්නිවේදනය කරන්නාක් මෙන් ම උඩු සිත ද යටි සිතට  ඇතැම් දෑ සන්නිවේදනයකරයි.

යටි සිතෙහි ඇති තොරතුරු උඩු සිත ද ආශ්‍රයෙන් ලබාගත් දෑ වෙයි. ඒ තොරතුරු, සාංසාරික පුරුද්ද, සත්ත්වයා ඉපිද ඇති භවයට අදාළ ජෛවීය හා සංස්කෘතික සාධක ආදිය අනුව යටි සිත යම් යම් නිගමනවලට එළඹෙයි. ඒ නිගමන පිළිබඳ ව උඩු සිතට ඇතැම් විට සන්නිවේදනය කෙරෙන අතර එවිට සත්ත්වයා ඒ පිළිබඳ සවිඥානිකවෙයි. අපි මේ කරුණ ද උදාහරණයක් මගින් තවදුරටත් පැහැදිලිකර ගනිමු.

මෙහි දී සිතෙයි හා සිතනවා යන වචන දෙක අපට වැදගත් වෙයි. අප යමක් සිතනවා යන්නෙන් අප ඒ පිළිබඳ සවිඥානික බව අදහස් වෙයි. සිතනවා යන්න උඩු සිතෙහි කාර්යයකි. යම් පුද්ගලයකු අවට සිරි නරඹමින් ඇවිදින්නේ යැයි සිතමු. ඒ පුද්ගලයා එසේ කරන්නේ සවිඥානික ව ය. අවට සිරි නැරඹීම කෙරෙන්නේ උඩු සිතෙන් ය. උඩු සිතෙන් ඒ පුද්ගලයා මල්ගස්වල ඇති මල් දකියි. ඒ මල් නරඹමින් සතුටක් විඳියි. මේ අතර ඒ පුද්ගලයාගේ යටි සිත ද ක්‍රියාත්මකවන බව  අමතක නොකළ යුතු ය.

© Prof. Nalin De Silva

හදිසියේ ම ඒ පුද්ගලයාට මලක් කැඩීමට සිතෙයි. මලක් කැඩීමට සිතෙයි යන්න වුවමනාවෙන් කළ දෙයක් නො වෙයි. ඇතැම් පුද්ගලයකුට එවැනි අදහසක් ඇති නොවීමට ද ඉඩ ඇත. මලක් කැඩීමට ඇතැමකුට සිතෙන්නේත් ඇතැමකුට එසේ නොසිතෙන්නේත් කෙසේ ද? මලක් කැඩීමට සිතෙයි යන්න යටි සිතෙහි ඇති වුවක් වෙයි. උඩු සිත සිතන අතර යටි සිතට සිතෙයි. යටි සිතෙහි ඇතිවන යමක් උඩු සිතට සන්නිවේදනය වූ විට ඒ අපට සිතෙන බව පෙනී යයි. යටි සිතෙහි ඇතිවන සියල්ල උඩු සිතට සන්නිවේදනය නො වෙයි. යමක් සන්නිවේදනය වුවහොත් එය සිතෙයි යනුවෙන් ගැනෙන බව පෙනීයයි.

සිතෙයි යන්නෙන් කියැවෙන්න යටි සිතෙහි පළමුව ඇති වී උඩු සිතට සන්නිවේදනයවන්නක් බැවින් ඒ අවිඥානික ක්‍රියාවක් වෙයි. එහෙත් යමක් සිතුනාට පසු අපි ඒ පිළිබඳ සවිඥානිකවෙමු. එනම් සිතෙන්නේ පළමුව යටි සිතට වුව ද, ඒ සිතිවිල්ල උඩු සිතට සන්නිවේදනයවීමෙන් පසු අපි ඒ පිළිබඳ සවිඥානික වෙමු. යටි සිතට ඇතිවන සිතිවිලි රාශියක් කිසිවිටෙකත් උඩු සිතට සන්නිවේදනය නොවන්නේ යැයි අපි ගනිමු. ඒ සිතිවිලි අවිඥානික වෙයි. අපට ඒ පිළිබඳ අවබෝධයක් නැත. එවැනි සිතිවිලි ඇතිවුණු බවක් හෝ අපි නො දනිමු. අප දන්නේ යටි සිතෙහි ඇති වී උඩු සිතට සන්නිවේදනයකෙරෙන සිතිවිලි ගැන පමණ ය. එවැනි සිතිවිලි ගැන අපි සවිඥානික වෙමු.

අප සමහරකුට මලක් කැඩීමට සිතෙන්නේ ඒ අයගේ සාංසාරික, ජෛවීය හා සංස්කෘතික පුරුදු අනුව යැයි අපට සිතිය හැකි ය. මල් නොකඩන ජීවීන් වන බල්ලන් බළලුන් ආදීන්ට මලක් කැඩීමට නො සිතෙනු ඇත. මල් නොකඩන සංස්කෘතියක උපන් අයකුට බොහෝවිට මල් කැඩීමට නො සිතෙනු ඇත. මෙහි දී අපි බොහෝවිට යැයි කියමු. එසේ සඳහන්කරන්නේ මල් නොකඩන සංස්කෘතියක උපන් අයකුට වුව ද මලක් කැඩීමට සිතෙන්නට ඉඩ ඇති බැවින් ය.. ඒ තැනැත්තාගේ සාංසාරික පුරුද්ද අනුව එසේ වීමට ඉඩ ඇත.

මල් නොකඩන සංස්කෘතියක උපත ලත් පුද්ගලයකුට එලෙස මලක් කැඩීමට සිතෙන්නේ ඒ පුද්ගලයා ඉහත භවයක මල්කඩා ඇති බැවින් ම නො වෙයි. ඒ පුද්ගලයාගේ යටි සිත ක්‍රියාකරන ආකාරය අනුව එසේ සිතීමට හැකි ය. එලෙස මලක්කැඩීමට සිතුණු පුද්ගලයා කරන්නේ කුමක් ද? ඒ තීරණයවන්නේ ද පුද්ගලයාගේ සාංසාරික පුරුදු අනුව ය. මල් නොකඩන සංස්කෘතියක ඉපදී මලක් කැඩීමට සිතුණු විට එක්කෝ මල කැඩිය හැකි ය. නැතහොත් මල නොකඩා සිටිය හැකි ය. මල කැඩුව ද නොකැඩුව ද එසේ කරන්නේ සවිඥානික ව ය.

මල් නොකඩන සංස්කෘතියක උපන් අයකුට මලක් කැඩීමට සිතුණ ද බොහෝවිට ඒ පුද්ගලයා සවිඥානික ව මල නොකැඩීමට තීරණය කරනු ඇත. ඒ සංස්කෘතික සීමාවන් ඉක්මවා යැමට බොහේවිට අපට නොහැකිවීම නිසා ය. එහෙත් සාංසාරික පුරුදු අනුව ධෛර්යය ප්‍රගුණ කර ඇති බැවින් හෝ හුදෙක් බරක් පතළක් නොසලකන බැවින් හෝ වෙනත් කරුණක් නිසා හෝ යමකු මල කැඩීමට තීරණයකර ඒ කඩනු ඇත. ඒ පුද්ගලයා ඒ සංස්කෘතියෙහි මලක් කැඩූ පළමු තැනැත්තා වනු ඇත. එමෙන් ම ඇතැම්විට ඒ අය සංස්කෘතිය වෙනස්කළ තැනැත්තකු ද වනු ඇත. ඒ අනෙක් පුද්ගලයන් ද ඉන්පසු මල්කැඩීමට පුරුදු වුවහොත් ය. මෙහි දී කිවයුතු කරුණක් නම් මල් කඩන සංස්කෘතියක වුව ද මලක් කැඩීමට සිතුණු පමණින් පුද්ගලයන් මල් නොකඩන බව ය. සිතෙන සෑම දෙයක් ම අපි නොකරමු. අප සිතුණු දේවලින් කරන්නේ එසේ කිරීමට උඩු සිත විසින් තීරණය කෙරෙන දේ පමණ ය.

සිතෙනවා යනුවෙන් කියැවෙන්නේ යටි සිතෙහි ඇති වී උඩු සිතට සන්නිවේදනය කෙරෙන සිතිවිලි සම්බන්ධයෙන් යැයි අපි සලකමු. යටි සිතෙහි ඇති වී උඩු සිතට සන්නිවේදනය නොවන සිතිවිලි ද වෙයි. අවිඥානික වූ මෙ ඇතැම් සිතිවිලි ද යටි සිතෙහි තොරතුරු ලෙස තැන්පත් වන්නේ යැයි සිතිය හැකි ය. මේ ඇතැම් දෑ උඩු සිතට ලබාගත හැකි ක්‍රම ද මිනිසුන් විසින් බොහෝ කාලයක් මුළුල්ලේ ගවේෂණය කෙරී ඇත. අප බොහෝවිට කතාකරන මෝහනය ඉන් එක් ක්‍රමයක් වෙයි. මෝහනය විවිධ ආකාරයෙන් කෙරෙන බැවින් එයට එක් ක්‍රමයක් යැයි කීම සමහරවිට සුදුසු නොවනවා විය හැකි ය.

© Prof. Nalin De Silva

බටහිර මනෝවිශ්ලේෂකයන් යැයි කියන්නවුන් බොහෝ විට කරන්නේ, එසේත් නැත්නම් කරනවා යැයි කියන්නේ මේ යටි සිතෙහි තැන්පත් වී ඇති එහෙත් උඩු සිතට එක එල්ලේ විෂය නොවන තොරතුරු ලබාගැනීම ය. එහෙත් එය කෙතරම් සාර්ථක දැයි අපි නොදනිමු. ඇතැම් අවස්ථාවල ඒ සාර්ථකවනවා විය හැකි ය. එහෙත් ඒ තොරතුරු ලබාගැනීම් ප්‍රවාදවලින් ස්වායත්ත නොවන බැවින් තොරතුරු අර්ථකථන පිළිබඳ ප්‍රශ්න ඇත. මෙය බටහිර මනෝවිශ්ලේෂණය සම්බන්ධයෙන් පමණක් නොව ප්‍රවාදාත්මක ඕනෑම මනෝවිශ්ලේෂණයකට පොදු වූවක් වෙයි.

සිහින යනු මොනවා දැයි  නිශ්චිත ව කිව නොහැකි ය. අප දකින සිහිනවලින් අපට මතක ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයක් පමණක් යැයි බටහිර මනෝවිශ්ලේෂකයෝ පවසති. ඒ පිළිගැනීම දුෂ්කර වූවක් නො වෙයි. සිහින ප්‍රධාන වශයෙන්ම යටි සිතෙහි කාර්යයක් වෙයි. නින්දේදී උඩු සිත ක්‍රියාත්මක නොවූව ද යටි සිත ක්‍රියාත්මක වෙයි. අඩ නින්ද යැයි පැවසෙන අවස්ථාවල උඩු සිත ද ක්‍රියාත්මක වන්නේ යැයි සිතිය හැකි ය. අපට අඩ නින්දෙන් යම් යම් දේ ඇසුණු බව අපි කියමු. එසේත් නැත්නම් නින්ද යාගෙන එන අවස්ථා ගැන සඳහන්කරමු. එවැනි අවස්ථාවල උඩු සිත ද ක්‍රියාත්මක වන බව පැහැදිළි ය.

කෙසේවෙතත් අපට මතක ඇති සිහින යනු යටි සිත විසින් යම්කිසි ආකාරයකට උඩු සිතට සන්නිවේදනයකෙරී ඇති තොරතුරු විශේෂයක් වෙයි. ඒ මතක ඇති සිහින දකිද්දී සමහරවිට උඩු සිත යම් ආකාරයකට ක්‍රියාත්මක වූවා විය හැකි ය. එසේත් නැත්නම් යටි සිත ඒ සිහින උඩු සිතට සන්නිවේදනය කළා විය හැකි ය. ඒ කුමක් වුවත් සිහින දැකීමේ දී ප්‍රධාන ක්‍රියාකාරකයා වනුයේ යටි සිත ය. ඒ සඳහා බොහෝ විට උඩු සිත අක්‍රියාත්මක විය යුතු ය. නින්දේ දී පමණක් නොව වෙනත් අවස්ථාවල දී ද උඩු සිත අක්‍රියාත්මක කළ හැකි නම් සිහින දැකීමට හැකිවිය යුතු ය. ඒ සිහින මතක තිබේ ද නැත් ද යන්න නම් වෙනත් ම කාරණයක් වෙයි. මෙහි දී සැලකිය යුතු කරුණක් නම් මොහොතකට හෝ දෙකකට උඩු සිත අක්‍රියාත්මක කිරීම ගැටළුවක් නොවන බවත් අප බොහෝ අවස්ථාවල එසේකරන බවත් ය. සිත් යනු අපේ ආකෘතිය අනුව ඇති වී නැති වී යන දෑ බැවින් එක් චිත්තක්ෂණයක ඇතිවන සිතක උඩු සිත කොටස අක්‍රියාත්මක ව තිබීම පුදුමයට කරුණක් නොවිය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva